# ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්හි තැන්පත්කරුවන් වෙත කෙරෙන නිවේදනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් වෙත නිකුත් කරනු ලැබ තිබූ බලපත්‍රය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 37 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2019.09.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලදී, තව ද ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය කල් බදු මුල්‍යකරණ ආයතනයක් ලෙස ලියාපදිංචි කරමින් නිකුත් කර තිබූ සහතිකය ද 2000 අංක 56 දරන කල් බදු මුල්‍යකරණ පනතේ විධි විධාන වලට අනුව 2019.10.09 සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ඇත.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්හි රක්ෂණය කරන ලද තැන්පතු සඳහා රක්ෂණ වන්දි ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු යොදා ඇත.

රක්ෂණ වන්දි ලබා ගැනීම සඳහා නියමිත පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමේ අයදුම්පත් ඊට අදාල අනෙකුත් අවශ්‍ය ලියවිලි ද සමග ඉදිරිපත් කරන මෙන් ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්හි තැන්පත් කරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. හවුල් ගිණුම් හිමියන් වන්දි සඳහා අයදුම් කිරීමේ දී වෙන් වෙන්ව ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා ගිණුම් හිමියන්ගේ බැංකු ගිණුම් වලට කෙලින් ම වන්දි මුදල් බැර කිරීම සිදු කෙරෙනු ඇත.

උක්ත කරුණට සම්බන්ධ වූ අදාළ අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන්, මාතර, මාතලේ, නුවරඑළිය, කිලිනොච්චි, ත්‍රිකුණාමලය සහ අනුරාධපුර යන ප්‍රාදේශීය කාර්යාල වලින් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය වන www.cbsl.gov.lk, වෙතින් ද ලබා ගත හැකි ය. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමේ අයදුම්පත් අනෙකුත් අවශ්‍ය ලියවිලි ද සමග 2019.11.15 දින හෝ එදිනට ප්‍රථම අධ්‍යක්ෂ, නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට, ලියා පදිංචි තැපෑලෙන් එවීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුලස්ථාන ගොඩනැගිල්ලේ තැපැල් අංශය වෙත පැමිණ භාර දීම හෝ කළ යුතු වේ. හිමිකම් පෑමේ අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි "TKSFL" ලෙස සඳහන් කළ යුතු ය.

මේ සම්බන්ධ වැඩි දුර තොරතුරු පහත දැක්වෙන දුරකථන අංකයන්ට ඇමතීමෙන් ලබා ගත හැකි ය.

**අධ්‍යක්ෂ**
**නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත**
**කොළඹ 01**

**වැඩිදුර විමසීම් සඳහා:**
**0112 - 398530**
**0112 - 477261**
**0112 - 477583**

**ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්**
**හිමිකම් අයදුම්පත සහ ප්‍රකාශය**
**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය**

නිළ හැඳුනුම් අංකය:
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

සෑම තැන්පතුකරුවෙකු/කාරියක ම හිමිකම් අයදුම් පතෙහි හවුල් ගිණුම්ද ඇතුළුව තමා සතු සියළුම ගිණුම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම සෑම තැන්පතුකරුවෙකු/කාරියක ම (හවුල් තැන්පතු හිමියන් ද ඇතුළත්ව) වෙන වෙන ම හිමිකම් අයදුම්පතක් බැගින් ඉදිරිපත් කළ යුතු වේ. මෙම අයදුම්පත සම්පූර්ණ කිරීමේදී මෙහි අවසානයට දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

**1. තැන්පතුකරු/කාරියගේ තොරතුරු:**

(අ) සම්පූර්ණ නම : ..............................................................................................

(ආ) හැඳුනුම්පත් අංක : (කරුණාකර උපදෙස් අංක 1, 4.1 සහ 4.4 බලන්න.)

(i) ජාතික හැඳුනුම්පත් අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය : ..........................................

(ii) විදේශ ගමන් බලපත්‍ර අංකය: ....................................(iii) රියදුරු බලපත් අංකය: ...........................

(ඇ) වර්තමාන ලිපිනය : ..............................................................................................

(ඈ) දුරකථනය: (ස්ථාවර දුරකථනය)................(ජංගම දුරකථනය) ................ විද්‍යුත් තැපෑල. ....................

**2. තැන්පතුකරු/කාරියගේ බැංකු ගිණුම් තොරතුරු** (වන්දි මුදල් බැර කිරීම සඳහා) : (කරුණාකර උපදෙස් අංක 4.3 බලන්න.)

(අ) ගිණුම් හිමියාගේ නම : ..............................................................................................

(ආ) බැංකුවේ නම : .......................................................... (ඇ) ගිණුම් අංකය : ..........................................................

(ඈ) ගිණුම පවත්නා බැංකු ශාඛාව : ..........................................................................

**3. 2019.09.19 දිනට තැන්පතු පිළිබඳ තොරතුරු:** (එකිනෙක තැන්පතුවලට අදාළ තොරතුරු වෙන වෙන ම සැපයිය යුතුය. අමතර තොරතුරු සඳහන් කිරීමට ඇත්නම් ඒ සඳහා වෙන ම පත්‍රිකාවක් භාවිතා කරන්න. කරුණාකර උපදෙස් අංක 3 සහ 4.2 බලන්න.)

| ගිණුම්/තැන්පතු සහතික අංකය | කාණ්ඩ අංකය | තැන්පතු වර්ගය ඉතුරුම්/ස්ථාවර (තනි පුද්ගල/හවුල්) | තැන්පතු වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| | | | |

**4. 2019.09.19 දිනට ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙත නොපියවූ ණය පිළිබඳ තොරතුරු** (නොපියවූ එකිනෙක ණයට අදාළ තොරතුරු වෙන වෙන ම සැපයිය යුතුය. අමතර තොරතුරු සඳහන් කිරීමට ඇත්නම් ඒ සඳහා වෙන ම පත්‍රිකාවක් භාවිතා කරන්න. කරුණාකර උපදෙස් අංක 4.5 බලන්න.)

(අ) ප්‍රදානය කරන ලද ණය මුදල: රු.............................................. (ආ) පොලී අනුපාතිකය: ...............................%

(ඇ) ණය මුදලේ කාලසීමාව: ........................................ (ඈ) ණය මුදල ප්‍රදානය කරන ලද දිනය: .......................

(ඉ) වාරිකයක වටිනාකම: රු.................................

(ඊ) වාරිකය ගෙවන ආකාරය (දෛනික, සතිපතා, මාසික) : ..............................................................................

(උ) වාරික ගෙවූ අවසාන දිනය: ...............................

(ඌ) මුල් ණය මුදලේ නොපියවූ වටිනාකම: රු.......................................

(එ) සම්පූර්ණ ණය මුදලේ නොපියවූ වටිනාකම: රු ............................... (ඒ) සුරැකුම් වර්ගය : .......................

**5. ප්‍රකාශය:** (කරුණාකර උපදෙස් අංක 2 බලන්න.)

(ලිපිනය) ..............................................................................................හි පදිංචි (තැන්පත්කරු/කාරියගේ හෝ නීත්‍යනුකූල හිමිකම්පාන්නාගේ නම) ..............................................................................වන මම (තැන්පත්කරු/කාරියගේ නම) .......................................................................... වෙනුවෙන් මෙම හිමිකම් අයදුම්පත ඉදිරිපත් කරන බවත්, ඉහත කී තැන්පතුවෙන් කිසිදු කොටසක් ලබා නොගත් බවත්, ඉහත තැන්පතු මුදල හෝ ඉන් කොටසක් පිටසන් කිරීමක් හෝ පැවරීමක් නොකළ බවත්, උක්ත ආයතනය වෙත මෙහි සඳහන් නොකළ කිසියම් වූ නොපියවූ ණය ශේෂයක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමි. තවද මෙහි සඳහන් සියලු ප්‍රකාශ සත්‍ය හා නිවැරදි බවට ද ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ කරන ගෙවීමකට අදාළව මගේ තැන්පතු සම්බන්ධයෙන් පොලී මුදලක්, අලාභයක්, පිරිවැයක්, ගෙවීමක් වැනි තුන්වන පාර්ශ්වයක් විසින් කරන යම් ඉල්ලීමක් හෝ හිමිකම්පෑමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සහ එහි කිසිදු සේවා නියුක්තිකයෙකු, නිලධාරියෙකු, එහි නියෝජිතයෙකු, ඒජන්තවරයෙකු කිසිදු වගකීමකට නොබැඳෙන බවට ද තැන්පතුකරු/කාරිය සහ හිමිකම් ලාභියා වන මම මෙහි ලා එකඟ වෙමි.

අත්සන: ........................................

ඉහත ප්‍රකාශය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව 2019...........................දින ................................හිදී මා ඉදිරියේදී අත්සන් තබන ලදී.

අත්සන:

..................................................................

නිල මුද්‍රාව: (නීතිඥ/ප්‍රසිද්ධ නොතාරිස්/දිවුරුම් කොමසාරිස්/සාම විනිසුරු)

**හිමිකම් අයදුම්පත පිරවීමට උපදෙස්**

1. හැඳුනුම්පත් පිළිබඳ තොරතුරු සඳහන් කිරීමේදී පහත සඳහන් උපදෙස් අදාළ වේ:

1.1. තනි පුද්ගල ගිණුම් සම්බන්ධයෙන් ජාතික හැඳුනුම්පත (ජා.හැ.)/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය;

1.2. බද්ධ ගිණුම් සම්බන්ධයෙන් එක් එක් ගිණුම් හිමියාගේ, ජා. හැ./විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය;

1.3. ළමා ගිණුම් සම්බන්ධයෙන් භාරකරුගේ, ජා.හැ./විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය සහ ළමයාගේ උප්පැන්න සහතිකය;

1.4. තනි පුද්ගල ව්‍යාපාර, ලියාපදිංචි නොකළ සමිති, සමාජ, හවුල් ව්‍යාපාර හෝ වෙනත් ලියාපදිංචි නොකල ඒකක සම්බන්ධයෙන් බලයලත් නිලධාරීන්ගේ/ හවුල්කරුවන්ගේ, ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර/ රියදුරු බලපත්‍ර;

1.5. සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සමාගම් සම්බන්ධයෙන් ලියාපදිංචි අංකය, පත්‍රිකා අංක 20 (අධ්‍යක්ෂවරුන්, ලේකම්, අධ්‍යක්ෂවරුන් විස්තර වෙනස් වීමේදී අදාල වන) සහ සමාගමේ වෙනස්වීම් සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ලියවිලි;

1.6. ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන යටතේ ලියාපදිංචි ආයතන සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන මගින් නිකුත් කළ ලියාපදිංචි අංකය සැපයිය යුතුය.

2. අදාළ තැන්පතුකරු/කාරිය (හවුල් ගිණුම් හිමියන් ද ඇතුළත්ව) විසින් ම හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කරන විට, අයදුම්පතෙහි, ප්‍රකාශය කොටසෙහි තැන්පතුකරු/කාරියගේ හෝ නීත්‍යනුකූල හිමිකම්පාන්නාගේ නම ඇතුළත් කිරීමට සහ තැන්පතුකරු/කාරියගේ නම ඇතුළත් කිරීමට වශයෙන් ඇති හිස් තැන් දෙකෙහි ම ඔහුගේ/ඇගේ නම ඇතුළත් කළ යුතු ය.

3. ස්ථාවර තැන්පතුවක් සම්බන්ධයෙන් වන විට තැන්පතුවේ වටිනාකම ලෙස තැන්පතුව අවසාන වරට අලුත් කිරීමෙන් පසු අදාළ වන අගය සඳහන් කළ යුතු අතර අලුත් කිරීමක් සිදු වී නැති නම් ස්ථාවර තැන්පතු සහතිකයේ මුහුණත් වටිනාකම සඳහන් කරන්න

4. අවශ්‍ය ලියවිලි පහත සඳහන් ආකාරයට අදාළ පරිදි අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

4.1. ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ ගිණුම්/ තැන්පතු ආරම්භ කිරීමේදී භාවිතා කළ අදාළ හැඳුනුම්පත්වල සහතික කළ ඡායා පිටපත්. (අදාළ හැඳුනුම්පත් පිටපත් නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු විසින් සහතික කළ යුතු ය.)

4.2. හිමිකම් කියනු ලබන මුදල නියමිත ලේඛනමය සාක්ෂි මගින් තහවුරු විය යුතු ය. එබැවින් හිමිකම් අයදුම්පත් සමග පහත දැක්වෙන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

ස්ථාවර තැන්පතු සඳහා - සියලුම ස්ථාවර තැන්පතු සහතිකවල මුල් පිටපත් සමග ආසන්නතම අලුත් කිරීමේ සහතික පත්‍ර

ඉතුරුම් ගිණුම් සඳහා - සියලුම ඉතුරුම් පාස් පොත්වල මුල් පිටපත්

තැන්පතු සහතික සඳහා - සියලුම තැන්පතු සහතිකවල මුල් පිටපත්

4.3. තැන්පතුකරුවන්/ කාරියන්ගේ බැංකු ගිණුම් තොරතුරු තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

ඉතුරුම් ගිණුමක් නම් - ගිණුම් හිමියාගේ තොරතුරු ඇතුළත් ඉතුරුම් පාස් පොතේ මුල් පිටුවේ පිටපතක්.

ජංගම ගිණුමක් නම් - ආසන්නතම මාසයේ ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්

4.4. තැන්පතුකරු/කාරියගේ නම සහ හැඳුනුම්පත් අංකය, ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ්හි තැන්පතු සහතික/පාස් පොත්වල සඳහන් නම සහ ගිණුම් ඇරඹීම සඳහා භාවිතා කළ හැඳුනුම්පත් (ජා.හැ., විදේශ ගමන් බලපත්‍ර හෝ රියදුරු බලපත්) අංකය සමග නොසැසඳේ නම් අදාළ වෙනස්කම පැහැදිලි කරමින් සහ නියම තැන්පතුකරු/කාරිය තමා වන බවට සහතික කරමින් දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු ඉදිරියේ අත්සන් තබන ලද නිසියාකාරයේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.

4.5. තැන්පත්කරු විසින් ටී. කේ. එස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙතින් ලබා ගත් ණය හෝ වෙනත් ගෙවීම් සම්බන්ධයෙන්-එවැනි ගෙවීම් තහවුරු කළ හැකි සියලුම ලියවිලි.